(අටවැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 22.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2015 නොවැම්බර් මස 27 වැනි සිකුරාදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

168/’15

1.

ගරු ලකී ජයවර්ධන මහතා,— සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය සමයේ දේශපාලන හේතූන් මත, උඩුනුවර මැතිවරණ බලප්‍රදේශයේ දිවි නැගුම දීමනා නොලැබූ අඩු ආදායම්ලාභී පවුල් සිටින බව එතුමා දන්නේද;

(ii) එසේ නම්, ඔවුන්ට කඩිනමින් එම දීමනා ලබාදීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උඩුනුවර මැතිවරණ බලප්‍රදේශය තුළ දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් මාසිකව දීමනා ලබාදෙන අඩු ආදායම්ලාභී පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට ලබාදෙන දීමනාවල මුළු මාසික වටිනාකම කොපමණද;

(iii) මෙම දීමනා කාණ්ඩ වශයෙන් වෙන්කර තිබේද;

(iv) එසේ නම්, කාණ්ඩ අනුව එක් එක් අයට දීමනා ලබාදෙන ආකාරය කවරේද;

(v) එසේ කාණ්ඩ අනුව දීමනා ලබාගන්නා පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) 2015 ජනවාරි 08 දින බිහිවූ යහපාලනය තුළ දිවි නැගුම දීමනාලාභීන් සඳහා දීමනා වැඩිකර තිබේද;

(vii) එසේ නම්, ඒ එක් එක් අයට මාසිකව දීමනා වැඩිවූ ආකාරය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) උඩුනුවර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය තුළ දිවි නැගුම දීමනා ලබන පවුල්වල නම්, ලිපිනයන් හා ඔවුන් ලබා ගන්නා දීමනා ප්‍රමාණයන්, ග්‍රාමසේවා කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් එතුමා සභාගත කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

173/’15

2.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් 2014 වසරේ ක්‍රියාත්මක කරන ලද “ගමෙන් ගමට—දොරින් දොරට” ව්‍යාපෘතිය යටතේ වෙන් කරන ලද මූල්‍ය ප්‍රතිපාදන මගින්, මාතර මහ නගර සභා බලප්‍රදේශයේ, පරමුල්ල, බෙහෙත් ගබඩාව පාර බෝක්කුව සංවර්ධනය කිරීම සඳහා මාතර මහ නගර සභාව සමග මාතර, වල්ගම උතුර, කොටිකාගොඩ රජමහා විහාර පාරේ, අංක 112/3, එකමුතු ගොවි සංවිධානය ගිවිසුම් ගත වූ බවත්;

(ii) ලිපිගොනු අංක ම.ම.න.ස/නා.ඉ.දෙ/wc-3/2014– දො.දො - 04 ගිවිසුම් ප්‍රකාරව, 2014 නොවැම්බර් 17 දින ඉදිකිරීම ආරම්භකර, 2014 දෙසැම්බර් වැඩ අවසන් කළ නමුත්, මෙතෙක් අදාළ කොන්ත්‍රාත් මුදල්, ගොවි සංවිධානය වෙත ගෙවා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) අදාළ ඉදිකිරීම් අවසන් කර, ගෙවීම සඳහා බිල්පත් ද ඉදිරිපත් කර ඇති මෙම කොන්ත්‍රාත්තුවට අදාළ මුදල, වල්ගම උතුර එකමුතු ගොවි සංවිධානය වෙත මුදා හරින දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

විසර්ජන පනත් කෙටුම්පත (2016) — (පස්වැනි වෙන් කළ දිනය) — විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2015 නොවැම්බර් 20) [1]

*2.

මුදල් අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නියෝග,— 2004 අංක 11 දරන මුදල් පනතේ 22 වැනි වගන්තිය සමග කියවිය යුතු 26 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 මැයි 18 දිනැති අංක 1915/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.11.03 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

මුදල් අමාත්‍යතුමා,— දේශීය ආදායම් පනත යටතේ යෝජනාව,— 2015.09.23 දින ඉදිරිපත් කරන ලද, ආදායම් මත වූ බදු සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදු පැහැර හැරීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ සිංගප්පූර් ජනරජයේ ආණ්ඩුව අතර, 2014 අප්‍රේල් මස 03 වැනි දින ඇතිකරගත් ගිවිසුම, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 97(1)(අ) වගන්තිය යටතේ අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය,— කලින් කලට සංශෝධනය කරන ලද (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 28 (අ) වැනි වගන්තිය සමඟ කියවිය යුතු, 16 (ඇ) වගන්තිය යටතේ සුරාබදු බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2015 පෙබරවාරි 13 දිනැති අංක 1901/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 973 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

මුදල් අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2014 සැප්තැම්බර් 30 දිනැති අංක 1882/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**
"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---